LAKSALA
State Gift & Souvenir Boutique

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

இலங்கை கைப்பணிப் பொருட்கள் சபை

Sri Lanka Handicrafts Board







වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report

2021

LAKSALA

STATE GIFT & SOUVENIR BOUTIQUE

වාර්ෂික වාර්තාව 2021

ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

පටුන

ආයතනික තොරතුරු	**01**
ලක්සල ප්‍රදර්ශනාගාර ජාලය	**02**
දැක්ම සහ මෙහෙවර	**03**
කාර්යය සමාලෝචනය සහ මෙහෙයුම් සමාලෝචනය	**04 - 11**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	**12**
ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම	**13**

මූල්‍ය වාර්තා

වර්ෂය පිළිබඳ සංක්ෂිප්තය	**16**
විස්තීරණ ආදායම් ප්‍රකාශය	**17**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	**18**
කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	**19**
මුල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	**20**
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**21 - 39**
විගණකාධිපති වාර්තාව	**40 - 52**

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ව්‍යවස්ථාපිත ස්වභාවය

1982 අංක **35** දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ

ප්‍රධාන කාර්යාලය

අංක : 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 7

දුරකථන : 011 2557132 / 011 2055501

ෆැක්ස් : 011 2594872

අලෙවි විමසීම්

ඊ-මේල් : info@laksala.gov.lk

වෙබ් අඩවිය : *www.laksala.gov.lk*

අලෙවි තොරතුරු

දුරකථන : 011 25**97797**
ඊ-මේල් : info@laksala.gov.lk

විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකු

ලංකා බැංකුව

මහජන බැංකුව

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ලක්සල ප්‍රදර්ශණාගාර ජාලය

1.කොටුව	අංක. **60,** යෝක් වීදිය, කොළඹ **01**.	**011-2323514**
2.තුම්මුල්ල	අංක.**215,** බෞද්ධාලෝක මාවත,තුම්මුල්ල, කොළඹ **07.**	**011-2580579**
3.නුවර	අංක.**05,** සංඝරාජ මාවත, නුවර.	**081-2222087**
4.කටුබැද්ද	අංක.**282,** ගාලු පාර, කටුබැද්ද මොරටුව.	**011-2605600**
5.ජාතික කෞතුකාගාරය	ලක්සල, කෞතුකාගාර පරිශ්‍රය, කොළඹ **07.**	**011-2698263**
6.බත්තරමුල්ල	අපේ ගම, පැලවත්ත, බත්තරමුල්ල.	**011-2786026**
7.වැලිපැන්න	දක්ෂිණ අධිවේගී මාර්ගය,විරාම මන්දිරය සේවා පෙදෙස ‘‘බී’’, ඒ**5** සහ ඒ**6**, වලගෙදර වැලිපැන්න.	**034-2241607/8**
8. ගාල්ල	අංක.**74/1,** සමුද්‍ර මාවත, ගාල්ල.	**091-2222783**
9.පින්නවල	අලි අනාථාගාරය, පින්නවල.	**035-2265015**
10.පේරාදෙණිය	අංක.**14,** උද්භිද උද්‍යානය, පේරාදෙණිය.	**081-2389253/63**
11.කටුනායක	**54** ඩී, සංක්‍රමණික වෙන්ව යාමේ කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, ,කටුනායක.	**011-2260167**
12.නුවරඑළිය	අංක. 79 පරණ උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය.	052-2234445

අපේ දැක්ම

ශ්‍රී ලංකාවේ ත්‍යාග සහ සමරු භාණ්ඩ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.

අපේ මෙහෙවර

ත්‍යාග සහ සමරු භාණ්ඩ ක්ෂේත්‍රය තුළ වර්ධනීය අවස්ථා පුළුල් කරමින් සහ සංචාරක කර්මාන්තයට උසස් වටිනාකම් එකතු කළ දායකත්වයක් සපයමින් ග්‍රාමීය නිපැයුම්කරුවන් හට පුළුල් වෙළඳපල අවස්ථා විවර කරමින් සමාජ වගකීම ඉටුකරන වාණිජ වශයෙන් සඵලදායී ආයතනයක් බවට පත්වීම

.

අපේ කේන්ද්‍රීය වටිනාකම්

- තත්ත්වය, විශ්වාසනීයත්වය සහ මුදලට වටිනාකම.
- විවිධ වූ මානයන්ගෙන් යුක්තව හොඳම පාරිභෝගික තේරීම උදෙසා අවස්ථා සම්පාදනය.
- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මාණය සහ වටිනාකම් හුවමාරුව.
- පාරිභෝගිකයා උපරිම ලෙස තෘප්තිමත් කිරීම.

තිරසර සංවර්ධන ඉලක්ක


- **2030** වසර වනවිට දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන නිපැයුම් ප්‍රමාණය දෙගුණ කරමින් දේශීය නිර්මාණ ප්‍රවර්ධනය.
- **2030** වසර වනවිට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කරගැනීමේ අරමුණින් ලක්සල වෙත භාණ්ඩ සපයන කාන්තා සැපයුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව **50%** කින් වර්ධනය කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව දිරිගැන්වීම පිණිස **2030** වසර වනවිට විශේෂ අවශ්‍යතා ඇති සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව **25%** කින් වර්ධනය කිරීම.




දේශීය අත්කම් නිපැයුම්කරුවන් හට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල අවස්ථා විවර කිරීමේ අරමුණින් **1964** වසරේදී ලක්සල ආයතනය ස්ථාපිත කරන ලද අතර **1982** අංක **35** දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් එය සංස්ථාපිත කරන ලදී. මෙකී ක්ෂේත්‍රය තුළ මේ වන විට ලක්සල රජය සතු පැරණිතම සහ විශාලතම ජාලය බවට පත්ව තිබේ.

මූල්‍ය කාර්යසාධන සාරාංශය

2021 සමාලෝචන වර්ෂය තුළ ලක්සල මුළු පිරිවැටුම රුපියල් 137,495,835.00 ක් වාර්තා කර ඇති අතර එහි විකුණුම් පිරිවැය රුපියල් 70,979,440.00 කි. පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ පසුගිය වසර පහ තුළ ලක්සල සමස්ත විකුණුම් වල සාරාංශයයි.




2021 වර්ෂය තුළ විකුණුම් විශ්ලේෂණයේදී තුම්මුල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය රුපියල් 53,131,642 ක් වූ අලෙවියක් සිදු කර විකුණුම් සඳහා ප්‍රධාන දායකත්වය ලබා දී ඇති අතර පිලිවෙලින් විකුණුම් පිරිවැටුම රුපියල් 9,736,767.00ක් හා රුපියල් 9,350,552.00ක් වාර්තා කරමින් කොටුව ලක්සල ප්‍රදර්ශනාගාරය හා ගාල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය 2021 වසරේ විකුණුම් ආදායම ඉහළ දායකත්වයක් ලබා දී ඇත.




<u>මිලදී ගැනීම් විශ්ලේෂණය</u>

2021 වර්ෂය තුළ ලක්සල විසින් රුපියල් 26,005,361.45 ක වටිනාකමකට වෙළඳ මිලදී ගැනීම් සිදු කර ඇත. පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ පසුගිය වසර පහ තුළ වෙළඳ මිලදී ගැනීමේ ප්‍රවණතාවයයි.




පහත ප්‍රස්ථාරයෙන් අයිතම වර්ගීකරණයට අනුව 2021 වර්ෂයට අදාළ මිලදී ගැනීම් තවදුරටත් නිරූපණය කෙරේ. 2021 වෙළඳ මිලදී ගැනීම් විශ්ලේෂණය කිරීමේදී, වෙළඳ මිලදී ගැනීම් වලින් ඉහළ ප්‍රතිශතයක් කලා සහ අත්කම් අංශයෙන් නියෝජනය වේ.




<u>වියදම් විශ්ලේෂණය</u>

වියදම්	Y2020	Y2021
පරිපාලන වියදම්	188,621,582	187,070,962
බෙදා හැරීම් වියදම්	17,834,739	8,239,659
මූල්‍ය පිරිවැය	37,004,985	42,050,371
	243,461,306	***237,360,992***

පහත ප්‍රස්ථාර මගින් පෙර වසර හා සැසඳීමේ දී මුළු වියදම්වල සංයුතිය දක්වයි.





කාර්ය සාධන සමාලෝචනය - 2021 වර්ෂය

පසුබිම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල 2021 වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය සතුටින් ඉදිරිපත් කරමි. දේශීය හස්ත කර්මාන්ත නිර්මාණකරුවන් හට දෙස් විදෙස් වෙළඳපල අවස්ථා ඇති කරලීමේ අරමුණ පෙරදැරිව ලක්සල ආයතනය 1964 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් ස්ථාපිත කොට ඇත. ලක්සල මෙම ක්ෂේත්‍රයේ රජය සතු පැරණි සහ විශාලතම අලෙවි ජාලය බවට මේ වන විට පත්ව ඇත.

උපාය මාර්ගික ප්‍රවේශය,

ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් තුළින් තම පිරිවැටුම හා ලාභදායීත්වය මෙන්ම තිරසාර පැවැත්මක් සඳහා අත්‍යාවශ්‍ය, පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කරගත් අතර අවශ්‍යතාවයන්ට සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. එනම්,

- **තම අලෙවිකරණ භාණ්ඩ කාණ්ඩ පුළුල් කරමින් නව වෙළඳපලක් ලබාගැනීම** (Category Expansion).
- **සන්නාමකරණය** (Branding) **තුලින් ආයතනයේ නාමය වෙළඳපළ තුළ ස්ථාපනය කිරීම.**
- **සංග්‍රහශීලී පාරිභෝගික සේවයකට අවශ්‍ය ආකාරයට සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප හා කුසලතා ගොඩනැංවීම.**
- **අන්තර්ජාලය හරහා ලක්සල භාණ්ඩ මිලදී ගැනීමේ පහසුකම් තව දුරටත් වර්ධනය කිරීම. (**Online sales Facilities)
- **ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වැනි ආයතන හා පෞද්ගලික සංචාරක ආයතන සමඟ නිරතුරුව සම්බන්ධතා පවත්වා ගෙනයමින් ලක්සල ප්‍රදර්ශනාගාර සඳහා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම.**

ලක්සල වෙළඳනාමය යටතේ හඳුන්වා දෙන ලද ලක්සල ප්‍රදර්ශනාගාර තුල අලෙවි කරනු ලබන සියලුම භාණ්ඩ පෙළ තවදුරටත් පුළුල් කරන අතර ඒවා ගුණාත්මක හා උසස් තත්වයේ තැගි හා සමරු භාණ්ඩ ලෙසින් දෙස් විදෙස් පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් පුළුල් කරනු ඇත. ඒ අනුව ඉතා උසස් තත්වයේ නවීන විලාසිතා වලින් අනූන භාණ්ඩ රාශියක් අලෙවිය සඳහා ප්‍රදර්ශනය කරන අතර ලක්සල ශ්‍රී ලංකාවේ තැගි හා සමරු භාණ්ඩ අලෙවිකරණයේ එකම රාජ්‍ය හා ප්‍රධාන වාණිජ ආයතනයක් බවට දෙස් විදෙස් පාරිභෝගිකයන්ගේ හදවත් තුළ රඳවා තබා ගැනීමට අවශ්‍ය අලෙවිකරණ කටයුතු පුළුල් කොට පාරිභෝගිකයින්, ආයතනය කරා තව තවත් ආකර්ෂණය කර ගැනීම හා රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

සන්නාමකරණය තුලින් ආයතනයේ නාමය වෙළඳපල තුළ ස්ථාපනය කිරීම

ලක්සල තම අලෙවි ප්‍රදර්ශනාගාර වර්තමාන වෙළඳපොළට සරිලන ආකාරයෙන් ඉතා උසස් මට්ටමකට පත් කරන ලදී. ඒ අනුව ලක්සල ප්‍රදර්ශනාගාර නවීකරණය කර දෙස් විදෙස් පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි ඉතා ඉහළ මට්ටමකට පත් කිරීම මෙන්ම ලක්සල වෙළඳ නාමය යටතේ නිෂ්පාදන හඳුන්වා දෙමින් භාණ්ඩ ප්‍රදර්ශනය ඉහළ මට්ටමක පවත්වාගැනීම හා සන්නාමකරණය තුලින් අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමටද කටයුතු කරන ලදී.

සංග්‍රහශීලී පාරිභෝගික සේවාවකට අවශ්‍ය වන පරිදි සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප ගොඩනැංවීම.

පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන් හට සංග්‍රහශීලි සේවයන් ලබා දීම සඳහා නව වෙළඳපොළට සරිලන ආකාරයට කටයුතු කළ හැකි සේවක මඩුල්ලක් පවත්වා ගැනීමට කටයුතු කිරීම සහ අවශ්‍ය නිසි පුහුණුව මෙන්ම පෙළඹවීම ඇති කිරීම තුළ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව වැටුප් හා දීමනා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව මත සිදුකිරීම තුලින් ඔවුන්ගේ උනන්දුව වර්ධනය කිරීම, තවදුරටත් ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බොහෝ දුරට උපකාරී වී ඇත.

නිෂ්පාදන අයිතමයන් පුළුල් කිරීම

නව උපාය මාර්ගික වැඩ පිළිවෙළ යටතේ ආයතනයේ කාර්යයන් පමණක් නොව තම වෙළඳ භාණ්ඩ කාණ්ඩයන්ද පුළුල් කිරීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව සහ අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ එක්ව අවශ්‍ය පියවර ගන්නා ලදී. දේශීය නිෂ්පාදනවල අනන්‍යතාවය රැකගනිමින් වර්තමාන වෙළඳපළ අවශ්‍යතා සඳහා නව නිර්මාණ ඉතා උසස් තත්වයෙන් යුතුව නිර්මාණය කොට වෙළඳපළට හඳුන්වා දීම හා මෙම තැගි සහ සමරු භාණ්ඩ කාණ්ඩයන්ට මැණික් සහ ස්වර්ණාභරණ, තේ, කුළු බඩු, සම් භාණ්ඩ, පිඟන් භාණ්ඩ මෙන්ම දේශීය වෙස් මුහුණු සහ අනෙකුත් සමරු නිර්මාණ හඳුන්වා දුන් අතර ලක්සල නව නිර්මාණ අංශය විසින් ද නව අත්කම් නිපැයුම් හඳුන්වා දීම තුලින් තැගි හා සමරු භාණ්ඩ ක්ෂේත්‍රයේ නව නිර්මාණ රාශියක් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

සැපයුම් ජාලය

ලක්සල සැපයුම් ජාලය මගින් ප්‍රදර්ශනාගාරවල අලෙවි කිරීමට අවශ්‍ය තැගි හා සමරු භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම එම භාණ්ඩ නිෂ්පාදනය සැලසුම් කිරීම, තත්ව පාලනය හා නවීන මෝස්තර ලබා දීම ද ඇතුළත් වේ. 2020 වර්ෂය අවසන් වන විට ක්‍රියාකාරී සැපයුම්කරුවන් සංඛ්‍යාව 243 ක් පමණ ලියාපදිංචි වූ සමස්ත දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව මෙම වසර තුළ තවදුරටත් වර්ධනය වී ඇති අතර නව වෙළඳපළ අවස්ථා වැඩි දියුණු කිරීම තුළින් නව නිෂ්පාදකයින් හට මෙම ක්ෂේත්‍රය තුළට පිවිසීමට අවස්ථාවන් පුළුල් කරන ලදී.

පරිපාලනය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සමස්ථ මෙහෙයුම් කටයුතු වලට අදාල අණපනත් , රාජ්‍ය චක්‍රලේඛ හා අනෙකුත් මූල්‍ය හා පරිපාලන උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද අතර යහපාලන හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කිරීමටද තහවුරු කරන ලදී. සංවිධානයේ ඉලක්ක හා පරමාර්ථ ලගාකර ගැනීම උදෙසා මෙන්ම අනෙකුත් සහායක සේවාවන් සැපයීම පිණිස පරිපාලන සහ මානව සම්පත් අංශය සැලකිය යුතු කාර්යභාර්යයක් ඉටුකරන ලදී. අදාල සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩලය 118කින් සමන්විත වන අතර එහි විස්තර පහත සඳහන් වේ.

2021/12/31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මට්ටම	**08**	
ද්විතික මට්ටම	**08**	
තෘතික මට්ටම	**54**	
ප්‍රාථමික මට්ටම	**09**	**79**
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය		**39**
මුළු ගණන		**118**

පෙර වසර සමඟ සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩල තත්ත්වය **129** සිට **118** දක්වා අඩු වී ඇත. තරඟකාරී අලෙවි පරිසරය තුළ මනා ලෙස සකසන ලද කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ව්‍යාපාර සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රයත්නයේදී මනා ලෙස පුහුණුව ලද, කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම යන්න තීරක කාර්යභාරයක් ඉටු කරයි.

අලෙවි කාර්ය මණ්ඩලය මෙන්ම සහාය කාර්ය මණ්ඩලය වෙත පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සේවයේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වර්ධනය කිරීමට පියවර ගනු ලැබිණි.

2020 වර්ෂයේ මුල සිට හා **2021** වසර තුලද පැතිර ගිය කොවිඩ් **19** ගෝලීය වසංගත තත්වය හා සංචරණ සීමා පැනවීම හේතුවෙන් දිවයිනට පැමිණෙන විදේශීය සංචාරකයින් හා දේශීය පාරිභෝගිකයින් බොහෝ සෙයින් අඩුවූ අතර ඒ හේතුවෙන් සැලසුම්කර තිබූ අලෙවි ඉලක්ක සපුරාගැනීමට නොහැකි වීම මත ආයතනයේ ආදායම බිඳ වැටිණි. ඒ අනුව අත්‍යාවශ්‍ය වියදම් පවා සපයා ගැනීමේ අසීරුතාවයකට මෙම මණ්ඩලට පත් විය.

2022 වසරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම යථාවත් වනු ඇතැයි අපේක්ෂා කරන හෙයින් ස්වයං මූල්‍ය වාණිජ ආයතනයක් ලෙස නව ව්‍යාපාරික සැලැස්මක් යටතේ අලෙවි කටයුතු තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

අංක	අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන්ගේ නම්	පත්වීම් කාල සීමාව	
		සිට	දක්වා
1.	සජිත් එම්. කොඩිකාර මයා	03.01.2020	02.05.2023
2.	මධුමාලී අල්විස් මිය (නීතීඥ)	03.01.2020	02.05.2023
3.	කේ.එල් මහින්ද සමරතුංග මයා	03.01.2020	09.01.2023
4.	එන්.පී.ඒ.ආර් ජයවර්ධන මිය	24.01.2020	02.03.2022
5.	ඩී. ජීවානාදන් මයා	09.10.2020	වත්මන්
6.	ප්‍රදීප් ගුණවර්ධන මයා *	12.10.2020	07.05.2021
7.	ලක්මල් වික්‍රමආරච්චි මයා * (නීතීඥ)	11.11.2020	23.12.2022
8.	සංජීව ධර්මවර්ධන මයා	08.06.2021	02.05.2023

* අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සභාපති ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

ජ්‍යෂ්ඨ කළමණාකරණ කණ්ඩායම

සී.එන්.දහනායක මහතා	වැ.බ කළමණාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
කේ.පී.පී.එස් කේ. පතිරණ මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක
කේ.සී.ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ (විකුණුම්)
ඊ.ඇලන් ඩෙලිල්කන් මහතා	වැ.බ අධ්‍යක්ෂ (මුදල්)
සම්පත් සෙනෙවිරත්න මහතා	වැ.බ අධ්‍යක්ෂ (සැපයුම් ජාල සංවර්ධන)
වජීරා සමරරත්න මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
දේවිකා කුමාරි අතුකෝරළ මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බෙදාහැරීම්)
ඒ.එල්.එම් රිස්වාන් මහතා	සහකාර අධ්‍යක්ෂ (ආදායම් හා වියදම්)
ගයාන් ලියනගේ මහතා	වැ.බ සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
දිනේෂ් අබේකෝන් මහතා	තොරතුරු තාක්ෂණ ඒකක ප්‍රධානී

අපේ කෘතඥතාව

පළමුව මම ලක්සල වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු බතික්, අත්‍යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා හට මහත් කෘතවේදීත්වය පුදදෙනු කැමැත්තෙමි. අප ආයතනය ක්ෂේත්‍රයෙහි ඉහලම ස්ථානයකට නංවාලනු පිණිස නිරතුරු ඇවැසි තීරණ සහ නිගමනයන් ලබාදීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්හටද කෘතවේදීත්වය පුදනු කැමැත්තෙමි.

තවද, අවශ්‍ය සෑම අවස්ථාවකම අප ආයතනයේ ප්‍රගතිය උදෙසා ලබාදුන් සහය වෙනුවෙන් මම අප අමාත්‍යාංශයේ ලේකම්තුමාට කෘතවේදීත්වය පළ කර සිටිමි.

එමෙන්ම ආයතනයේ පරිපාලන, මූල්‍ය සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් එලදායීව තම සේවක මණ්ඩලය මෙහෙයවූ අංශ ප්‍රධානීන්ට මෙන්ම ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා එලදායීව පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන ලද අනෙකුත් සමස්ථ කාර්ය මණ්ඩලය වෙතද මාගේ ස්තුතිය පුද කරමි.

අප සමග අත්වැල් බැඳගනිමින් පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන, නව නිපැයුම් හඳුන්වා දෙමින්, සම්ප්‍රදායික මෙන්ම නව්‍ය වූ නිපැයුම් ඇතුළුව අත්කම් සහ සමරු භාණ්ඩ සපයමින් අප හා එක්වූ නිපැයුම්කරුවන්ට මෙහිදී විශේෂ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි. එසේම සෑම අවස්ථාවකම අප ආයතනය මත විශ්වාසය රැඳවූ දේශීය මෙන්ම විදේශීය ගණුදෙනුකරුවෝද අපේ විශේෂ ස්තුතියට හිමිකම් ලබති.

අනාගතයේදී ශ්‍රී ලාංකික ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වයන් නගා සිටුවීමට ඇවැසි සියළු පියවර අප ආයතනය මගින් ගනු ලබන බව ප්‍රකාශ කරන අතරම ඉදිරි වසරවලදී අපගේ අලෙවිය රුපියල් බිලියනයක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද අවසන් වශයෙන් පවසමි.

තවද, ආයතනයේ මානව සම්පත මෙන්ම භෞතික සම්පත්ද ක්‍රමිකව කළමණාකරනය කිරීම හරහා සමස්ත කාර්ය මණ්ඩලයෙන්ම කාර්යක්ෂම සහ සඵලදායී දායකත්වය ලබාගනු පිණිස සකසන ලද උපායමාර්ගික සැලසුමකට අනුව ආයතනයේ පොදු කාර්ය පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහත හෙලමින් 2022 වසර තුළ අපගේ ලාභ ප්‍රතිශතය වර්ධනය වන තත්වයක පවත්වා ගැනීමටද සැලසුම් සකස් කර ඇත.

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන

2021 දෙසැම්බර් **31**

2021

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
2021 ආදායම් විශ්ලේෂණය


වර්ෂය පිළිබඳ සංක්ෂිප්තව - *ගෝලීය සන්දර්භය සහ ශ්‍රී ලංකා ආර්ථිකය*

2021 වර්ෂයේ දී ද COVID-19 වසංගත තත්ත්වයට එරෙහිව ගෝලීය ආර්ථිකය අඛණ්ඩව 2 වන වසරටත් සටන් වදිමින් සිටියේය. එහි අඛණ්ඩ සහ පැතිරුණු ප්‍රතිඵලය ශ්‍රී ලංකා ආර්ථිකයට ඉතා දරුණු ලෙස බලපා ඇත.

2019 වසරේ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ 2020/2021 වසංගත තත්ත්වය 2019 වසරේ සිට දිවයිනේ සංචාරක කර්මාන්තයට ඍජුවම බලපා ඇති අතර එය වරින් වර ලොව පුරා සංචාර තහනම් කිරීමට හේතු විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ වසා දැමීම සහ රට වසා දැමීමත් සමඟ රටේ බොහෝ සංවිධානවලට අවභිරතා ඇති විය. ලක්සල මූල්‍ය තත්ත්වය ද මෙයට වෙනස් නොවීය. මෙම තත්වයන් යටතේ ලක්සලට 2020 සහ 2021 වසර පුරා බලවත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. මාසික මෙහෙයුම් වියදම් කළමනාකරණය කිරීමට පවා ආයතනයට ආදායමක් නොතිබුණි. 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දළ වශයෙන් රු. මි. 44.1 ක ප්‍රදානයක් සමඟ කාර්ය මණ්ඩල වැටුප් ඇතුළු මාසික මෙහෙයුම් වියදම් ප්‍රදානය කිරීමට මහා භාණ්ඩාගාරය හරහා රජය මැදිහත් විය.

එසේම ලක්සල සැපයුම්කරුවන්ට අඛණ්ඩව වසර 2 ක් සඳහා ලබා දෙන සැපයුම් සඳහා ගෙවීම් අහිමි වූ බැවින් 2021 ජුනි මාසයේදී හිඟ සැපයුම්කරුවන්ගෙන් කොටසක් පියවීම සඳහා මහා භාණ්ඩාගාරය රුපියල් මිලියන 38.6 ක ප්‍රදානයක් ලබා දුන්නේය.

COVID-19 ලක්සල විකුණුම් ආදායමට ඇති කළ බලපෑම පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කෙරේ.



ලක්සල විකුණුම් ආදායම පෙර වර්ෂයේ විකුණුම් අගය වූ රු. මි. 194 සිට 2021 වර්ෂයේදී රු. මි. 137 දක්වා දැවැන්ත ලෙස පහත වැටී ඇති අතර එය 2020 වර්ෂයට සාපේක්ෂව 29% ක අඩුවීමකි. අවම මට්ටමින් ක්‍රියාත්මක වුවද පරිපාලන වියදම් රු. මි. 187ක් විය. බෙදාහැරීමේ පිරිවැය රු. මි. 8 ක් වූ අතර එය 2020 වසරට සාපේක්ෂව 56% ක සැලකිය යුතු අඩුවීමකි. ප්‍රදර්ශනාගාර වසා දැමීම සහ අත්කම් නිෂ්පාදන මිලදී ගැනීම් අඩුවීම හේතුවෙන් 2021 වසරේ දී බෙදාහැරීමේ පිරිවැය 50%කට වඩා අඩු වී ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම	**3**	137,495,835	194,740,004
විකුණුම් මිල		(70,979,440)	(85,307,833)
දළ ලාභය		**66,516,395**	**109,432,171**
ලැබී ඇති ආධාර		82,905,000	21,466,252
වෙනත් ආදායම්	**4**	29,392,750	6,818,812
පරිපාලන වියදම්	**5**	(187,070,962)	(188,621,582)
විකිණීම් සහ බෙදා හැරීමේ වියදම්	**6**	(8,239,659)	(17,834,739)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ප්‍රතිඵල		**(16,496,476)**	**(68,739,086)**
මූල්‍ය පිරිවැය	**7**	(42,050,371)	(37,004,985)
බදුවලට පෙර ලාභය		**(58,546,847)**	**(105,744,071)**
බදු	**8**	-	-
වර්ෂය සඳහා ලාභය		**(58,546,847)**	**(105,744,071)**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	**09**	**829,595,922**	897,120,392
මුළු ජංගම නොවන වත්කම්		**829,595,922**	**897,120,392**
ජංගම වත්කම්			
භාණ්ඩ වට්ටෝරු	**10**	**545,265,950**	619,209,585
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	**11**	**106,938,043**	71,085,017
මුදල් සහ මුදලට සමාන දෑ	**12**	**37,790,147**	28,002,906
මුළු ජංගම වත්කම්		**689,994,140**	**718,297,508**
මුළු වත්කම්		**1,519,590,062**	**1,615,417,900**
හිමිකම් සහ බැඳීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		**69,628,878**	69,628,878
ප්‍රාග්ධන සංචිත		**510,806**	510,806
ප්‍රත්‍යාගණන සංචිත		**454,366,157**	454,366,157
ප්‍රාග්ධන දීමනා		**107,951,172**	107,951,172
රඳවාගත් ඉපැයුම්		**(184,017,430)**	(125,845,784)
සම්පූර්ණ හිමිකම්		**448,439,584**	**506,611,229**
ජංගම නොවන බැඳීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	**13**	**56,925,460**	56,203,979
විලම්බිත ආදායම	**14**	**24,164,714**	49,504,712
දිගු කාලීන ණය ගැනීම්	**15**	**383,781,882**	385,279,409
මුළු ජංගම නොවන බැඳීම්		**464,872,056**	**490,988,100**
ජංගම බැඳීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	**16**	**482,273,952**	522,556,559
ගෙවිය යුතු ආදායම් බදු	**8**	**21,798,486**	20,811,536
කෙටි කාලීන ණය ගැනීම්	**17**	**101,219,872**	69,096,784
බැංකු අයිරා	**18**	**986,112**	5,353,692
මුළු ජංගම බැඳීම්		**606,278,422**	**617,818,571**
මුළු බැඳීම්		**1,071,150,478**	**1,108,806,671**
මුළු හිමිකම් සහ බැඳීම්		**1,519,590,062**	**1,615,417,900**

.....

ඊ. ඒ. ඩෙලිල්කන් මහතා
මූල්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 05-09-2022 දින තුම්මුල්ල ලක්සලේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙදී අත්සන් කරන ලදී.

.....	.....	.....
එස්.එම්.කොඩිකාර මහතා	ආර්.කේ.එල් ජාගොඩ මිය	ලක්මාල් වික්‍රමආරච්චි මහතා
මණ්ඩල සාමාජික	**මණ්ඩල සාමාජික**	**සභාපති**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් **31** න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රාග්ධන ප්‍රදාන	රඳවා ගත් ඉපැයීම්	මුළු හිමිකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2020 ජනවාරි **1** වන දිනට ශේෂය	69,628,878	510,806	454,366,157	107,951,172	(18,714,487)	**613,742,526**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්	-	-	-	-	(1,387,226)	**(1,387,226)**
වර්ෂය සඳහා ලාභය					(105,744,071)	**(105,744,071)**
2020 දෙසැම්බර් **31** දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(125,845,784)**	**506,611,229**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්					375,201	**375,201**
වර්ෂය සඳහා ලාභය	-	-	-		(58,546,847)	**(58,546,847)**
2021 දෙසැම්බර් **31** දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(184,017,430)**	**448,439,584**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	සටහන්	2021	2020
මෙහෙයුම් වලින් උපයන මුදල්		රු.	රු.
බදු වියදමට පෙර ලාභය		**(58,546,847)**	**(105,744,071)**
ගැලපීම් :			
පාරිතෝෂික ශේෂය ගැලපීම් 2020		(1,393,899)	-
ගොඩනැගිලි සංවර්ධන ගැලපීම් 2020		277,696	-
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		3,682,500	7,129,839
පොලී වියදම්		41,938,619	36,856,652
ක්ෂයවීම්		26,440,306	26,414,467
ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය		25,590,164	25,600,365
පෙර වසර ගැලපීම		375,201	(1,387,226)
ප්‍රදාන ක්‍රමක්ෂය		(25,340,004)	(25,340,000)
		13,023,737	**(36,469,974)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
භාණ්ඩ වට්ටෝරු		73,943,636	18,220,995
වෙළඳ සහ අනෙකුත් ලැබීම්		(35,853,026)	15,275,152
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් - බදු සමග		(39,295,657)	20,912,419
මෙහෙයුම් වලින් ඉපයූ මුදල්		**11,818,689**	**17,938,592**
ගෙවන ලද පාරිතෝෂික		(1,567,120)	(1,821,898)
ගෙවන ලද පොලී		(41,938,619)	(36,856,652)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**(31,687,050)**	**(20,739,958)**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම		15,216,310	(1,869,331)
ආයෝජන කාර්යයන් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**15,216,310**	**(1,869,331)**
මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ			
ලබා ගත් දිගු/කෙටි කාලීන ණය		115,135,218	26,707,791
ණය ආපසු ගෙවීම		(84,509,657)	(4,058,524)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**30,625,561**	**22,649,267**
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**14,154,821**	**39,979**
වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		22,649,214	22,609,235
වසර අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		**36,804,035**	**22,649,214**
බැංකු අයිරා	**18**	(986,112)	(5,353,692)
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	**12**	37,790,147	28,002,906
		36,804,035	**22,649,214**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.0 සමාගම

"ලක්සල" යන වෙළඳ නාමය යටතේ ජනප්‍රියත්වය ලැබ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (SLHB හෙවත් "ලක්සල") ශ්‍රී ලංකාව පුරා නිෂ්පාදනය කරනු ලබන අත්කම් නිර්මාණ අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන රජය සතු එකම ආයතනය වේ.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

SLHB හි ප්‍රධාන කාර්යයන් වන්නේ දේශීය සහ විදේශීය වෙළඳපොළට ත්‍යාග සහ සිහිවටන අයිතම අලෙවිකරණය සහ විකිණීමයි.

2. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.0 මිනුම්කරණ පදනම

2021 දෙසැම්බර් **31** දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ (මූල්‍ය ප්‍රකාශන) සටහන් ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරි අයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්වලට (SLFRSs) අනුව සකස් කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශන, සාධාරණ අගය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ වගකීම් සඳහා හැරුණු කොට ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

2.1 ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ තීන්දු භාවිතය

ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රකාශ අදාළ කරගැනීමට බලපාන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන ගොඩනැගීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම LKAS (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත) සහ SLFRSවලට අනුකූලව සිදු කර ඇත. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන ඓතිහාසික පරිචය සහ වෙනත් මූලාශ්‍ර මගින් නොපෙන්වන ඉදිරියට ගෙන ආ වත්කම් සහ වගකීම් වටිනාකම්, තීන්දු ගැනීමේ පදනම සකසන අවස්ථාවල දී ලැබෙන ප්‍රතිඵල යටතේ සාධාරණ යයි විශ්වාස කරන වෙනත් විවිධ සාධක මත පදනම්ව ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා ඉහත කී උපකල්පන ඉදිරියට ගෙනයන පදනම මත සමාලෝචනය කර ඇත. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන කාලය තුල දී එකී සංශෝධන එකී කාලය සඳහා පමණක් හෝ සංශෝධනය කරන කාලයේදී සහ අනාගතයේදී බලපාන්නේ නම් හෝ වර්තමාන සහ අනාගත යන කාල දෙකම සඳහා බලපාන්නේ නම් හෝ එකී කාල තුලදී හඳුනාගෙන ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට සංවිධානය සතු වගකීම පිළිබඳව අපි තක්සේරුවක් කර ඇත්තෙමු. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින්, ඈවර කිරීමේ හෝ වෙළඳාම නතර කිරීමේ අවශ්‍යතාවයක් අපි අපේක්ෂා නොකරමු.

2.3 සන්සන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුව ක්‍රියාවට නංවා ඇති අතර පෙර වසරේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා නැවත වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1.0 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇති අතර මණ්ඩලය විසින් ද නිරතුරුව ම ක්‍රියාත්මක කරගෙන ඇත.

2.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි තාක් දුරට ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ගිණුම්ගත කළ අගයේ සාධාරණ වටිනාකමට හෝ වෙළඳ වට්ටම් සහ අදාළ බදුවල ශුද්ධ ලැබිය යුතු අගයට වේ.

විදේශ මුදලින් සිදු කෙරෙන ගනුදෙනුවල දී එම ගණුදෙනුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව විනිමය පරිවර්තනය කරනු ලැබේ.

ශේෂ පත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍ය වත්කම් සහ වගකීම් එදිනට පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

2.4.2 දේපළ පිරියත සහ උපකරණ

අ) හඳුනා ගැනීම සහ මිනුම්කරණය

වත්කම් හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ මෙම වත්කම්වල පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් දේපල, පිරියත සහ උපකරණ හඳුනාගැනීමේ පදනම ලෙස පිළිගැනේ.

ඉඩම් හැර දේපල පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ ඕනෑම සමුච්චිත හායන පාඩුවක් අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැයට, වත්කම් අත්කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත් වේ. ස්වයං - නිර්මිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය පිරිවැය , සෘජු ශ්‍රමය, ස්වකීය අපේක්ෂිත පරිහරණය සඳහා ක්‍රියාකාරී තත්ත්වයකට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් පිරිවැය, සහ භාණ්ඩ ගලවා ඉවත් කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුළත් වේ. දේපල, පිරියත සහ උපකරණ එකිනෙකට වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාල සහිත ප්‍රධාන උපාංගවලින් සමන්විත වන විට ඒවා දේපල, පිරියත සහ උපකරණවල වෙනම අයිතමයන් වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණවල ඉදිරියට ගෙන යන වටිනාකම නැවත ලබාගත නොහැකි බව පෙනී යන අවස්ථාවක ඉදිරියට ගෙන යන වටිනාකම හායනයක් ලෙස හඳුනා ගනී.

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් අපහරණය කිරීමේදී ලැබෙන ලාභයක් හෝ අලාභයක් එකී අයිතමයන් විකිණීමෙන් ලැබෙන මුදල් හා වත්කම් හි ඉදිරියට ගෙන යාමේ අගය සසඳා තීරණය කරනු ලබන අතර එය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලැබේ.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සතු ඉඩම් සහ ගොඩනැඟිලි **1993** දී ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා දෙන ලදී. මෙයට රු. **112.330,000/=** ක් වටිනා දේපළ **11** (එකොළහක්) ඇතුළත් විය. **2012-2013** වර්ෂයේ දී SLHB ආයතනය ප්‍රතිව්‍යුහගත කරන විට රුපියල් **20,700,000/=** ක වටිනාකමකින් යුත් දේපළ තුනක් **(3)** අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ජාතික ශිල්ප සභාවට පවරා දී ඇති අතර ඉතිරිය SLHBහි ශේෂ පත්‍රයේ පවතී.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආ) ක්ෂය වීම

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයට එරෙහිව ලියා හැරීම සඳහා වන ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත සහ උපකරණ පිරිවැය මත සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි.

භාවිතා කරනු ලබන ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

1. ගොඩනැගිලි	**2.5%**
2. යන්ත්‍රෝපකරණ	10%
3. ඉන්වෙන්ට්‍රි ද්‍රව්‍ය	10%
4. ගෘහ භාණ්ඩ	10%
5. පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	20%

*2018 වසර දක්වා පරිගණක අයිතමවල ක්ෂයවීම් සිදු කරනු ලැබුවේ සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි. නමුත් මෙම අයිතම වර්ෂ **8**කට ඉහතදී මිලදී ගෙන ඇති බැවින් සරළ රේඛා ක්‍රමයට ගණනය කිරීමේදී ක්ෂය කළ අගය, එකතු කළ මුළු අගය ඉක්මවා යන බැවින් 2019 වර්ෂයේදී හීනවන ශේෂ ක්‍රමය භාවිත කිරීමට ලක්සලට සිදු විය. එමගින් **2019** වසරේ සිට හීනවන ශේෂ ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

ඇ) දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය / අලාභය.

දේපල, පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් වන යම් ලාභයක් හෝ පාඩුවක් විකිණීම සිදුවන කාලසීමාව තුල හඳුනාගන්නා අතර එය වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කරයි.

(ඈ) ප්‍රදාන ක්‍රමක්ෂය අනුපාතිකය සහ ගොඩනැගිලි සංවර්ධන වියදම් ක්ෂයවීම හරහා ලාභයට හා අලාභයට අනවශ්‍ය ආදායමක් හෝ වියදම් පැමිණීම වැළැක්වන අයුරින් ප්‍රදාන ක්‍රමක්ෂ අනුපාතිකය සහ ගොඩනැගිලි සංවර්ධන වියදම් ක්ෂයවීම් ඒ අනුව සකස් කර ඇත.

2.4.3 නොනිමි ප්‍රාග්ධනය

වර්ෂය තුළ දරන ලද,මූල්‍ය ප්‍රකාශ දිනට සම්පූර්ණ කර නොමැති ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගෙවීම් ලෙස පෙන්වනු ලබන අතර, වර්ෂ අවසානයේදී සම්පූර්ණ කර ඇති ප්‍රාග්ධන වත්කම් භාවිතයට ගත් වර්ෂය අවසානයේ දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කර ඇත.

2.4.4 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් අත්පත් කර ගන්නා ලද නිශ්චිත ප්‍රයෝජ්‍ය ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අඩු කළ සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි පාඩු මත මනිනු ලැබේ.

අ) හඳුනාගැනීමේ පදනම

වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් සහ පිරිවැය අඩු සමුච්චිත ක්‍රමක්ෂ සහ සමුච්චිත හායන පාඩු යටතේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

ආ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය අදාළ වන නිශ්චිත වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අභ්‍යන්තරව ජනනය කරන ලද වියදම් කීර්ති නාමය සහ සන්නාම ඇතුළු අනෙකුත් සියලුම වියදම්, ආදායම් ප්‍රකාශනයේ දරන ලද ලෙස පිළිගැනේ.

ඇ) කාර්යයෙන් බැහැර කිරීම සහ අපහරණය

අපහරණය කිරීමේදී හෝ අපහරණයෙන් පසුව භාවිතයෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා නොගනී.

ඇ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘෂ්‍ය වත්කම් භාවිතය සඳහා පවතින දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මත සරළ රේඛීය ක්‍රමයට ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කිරීම හඳුනා ගැනේ.

2.4.5 හායනය

වත්කම් හායනය පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේද යන්න තහවුරු කිරීම සඳහා SLHBහි වත්කම් ප්‍රමාණය එක් එක් මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනයන්හි දී සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, වත්කමේ ප්‍රතිස්ථාපන වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ඉදිරියට ගෙන යන වටිනාකම හෝ එයින් උත්පාදන කළ හැකි මුදල, එහි ප්‍රතිස්ථාපන වටිනාකම ඉක්මවන විටක හායන අලාභයක් හඳුනාගනු ලැබේ. ආදායම් ප්‍රකාශය තුළින් හායන පාඩු හඳුනා ගනු ලැබේ.

2.4.6 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාරයේ දී විකුණන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල්ය. වසරක් හෝ ඊට අඩු කාලයකින් එකතු කිරීම අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ ඊටත් වඩා දීර්ඝ වන්නේ නම්), ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

2.4.7 භාණ්ඩ තොග

භාණ්ඩ තොග, නියත සහ අළුත්වැඩියා කළ හැකි අයිතම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට අගය කරනු ලැබේ. පිරිවැය, බරතැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුරදී තොගය විකිණිය හැකි මිල වේ.

2.4.8 මුදල් සහ මුදලට සමාන දෑ

අතැති මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලී ආයෝජන, මුදල් හා මුදලට සමාන දෑ ලෙස අර්ථකථනය කරන අතර අතැති මුදල් හා ඉතිරි ශුද්ධ බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන මුදල් සහ මුදලට සමාන දෑ ලෙස සැළකේ.

2.4.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමය භාවිත කරමින් සකස් කර ඇත.

2.4.10 සේවක ප්‍රතිලාභ

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වන වගකීම, **2021** කාලපරිච්ඡේදය තුල ආයතනයේ සේවකයන් **118** දෙනෙකු ආවරණය කරනු ලබන නිශ්චිත වූ ප්‍රතිලාභ සැලැස්මකි. මෙම වගකීම සම්පූර්ණ කිරීම සඳහා සෑම සේවකයකුගේම සේවය ආරම්භ කළ පළමු වර්ෂයේ සිට සම්පූර්ණ කරන සෑම වර්ෂයක් සඳහා ම අදාළ මුල්‍ය වර්ෂයේ අවසාන මාසයේ වැටුපෙන් අඩක් මත පදනම් ව ගණනය කළ මුදලට සමාන වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශයේ දිනට ඉදිරියට ගෙනයනු ලැබේ. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ වෙන්කිරීම් සහ වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය වෙන් කිරීම් අතර වෙනස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සළකා බලනු ලැබේ.

ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ නියෝග අනුව සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සහ සේවා නියුක්තියන්ගේ භාර ආරමුදලට දායකත්වය සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සේවකයන්ගේ පූර්ණ සේවා නියුක්තිය මත සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පිළිවෙලින් 12% සහ 3%ක දායකත්වයක් දක්වයි.

2.4.11 ණය ගැනීම්

ණය ගැනීම් මූලිකව, සාධාරණ අගය, ගණුදෙනුවල පිරිවැයේ ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ.පසුගිය කාලවලදී ණය ගැනීම් මිල සඳහන් කරනු ලැබුවේ සළුල පොලී ක්‍රමය භාවිත කරමින් හිලව් කළ පිරිවැයටය.එම කටයුත්තේ යම් වෙනසක් (ශුද්ධ ගණුදෙනු පිරිවැය) සහ ණය නිදහස් කිරීමේ වටිනාකම ණය ගැනීම් කළ කාලය තුල ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනියි.

2.4.12 බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධින්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නෛතික/සාධනීය බැඳීමක් පවතින විට බැරකම් සහ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල පිළිගනු ලබන අතර, ඒවා පියවීම තුලින් ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාම අපේක්ෂා කෙරේ. මූල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ණය හිමියන්ගේ ඉල්ලීම පිට ගෙවිය යුතු බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් ලෙස සැළකේ. මූල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්ව පිළිබඳ විස්තීරණ ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් ලෙස සැළකේ.

අ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල සැපයුම්කරුවන් වෙතින් ලබා ගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට බැඳී සිටින මුදල් ගෙවිය යුතු වෙළඳ ගෙවිය යුතු දෑ වේ.ගෙවීම වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුලදී (දීර්ඝ ව්‍යාපාර කටයුත්තකදී නම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල) ගෙවිය යුතු වේ නම් එම ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකම් ලෙස වර්ග කෙරේ. එසේ නොවේ නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස ඉදිරිපත් කෙරේ.

නියෝජන තොග ඇතුළුව සියළු මිලදී ගැනීම් සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍ර රැස් කිරීමේ අවස්ථාවේ ගිණුම් පොත්වල වගකීම් වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය ලක්සල අනුගමනය කර තිබුණි. කෙසේ වෙතත්, තොග ණය හිමියන්ට ගෙවීම් කරනු ලබන්නේ අදාළ තොග තොග අලෙවි කරන විට පමණි.

2.4.13 ආදායම් බදු

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මෙහෙයුම් කටයුතු සහ උපයනු ලබන බදු අයකළ හැකි ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනට මෙරට පනවා ඇති හෝ හරයාත්මකව පනවා ඇති බදු නීතිය මත පදනම්ව වර්තමාන ආදායම් බදු ගාස්තු ගණනය කරයි. අදාළ බදු නියාමනය අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල තත්ත්වයන් කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරයි. බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මත පදනම්ව අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපාදන සළසයි.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකුණුම් ආදායම, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිලාභ, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ වට්ටම් පිළිබඳ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ. හිමිකාරිත්වයේ සුවිශේෂී අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට මාරු වී ඇති, ප්‍රතිෂ්ඨාව අයකර ගැනීමට හැකි, ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩවල විභව්‍ය ප්‍රතිලාභ විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි සහ භාණ්ඩ පිළිබඳ කළමනාකරණයේ සම්බන්ධයක් නොමැති අවස්ථාවක ආදායම හඳුනාගනු ලැබේ. අවදානම සහ ප්‍රතිලාභ මාරු වීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ පුද්ගලික නියමයන් අනුව වෙනස් වේ.

වෙනත් මෙහෙයුම් ආදායම්

අ) දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය සහ පාඩුව

ආ) දේපළ , පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීම හෝ අපහරණය කිරීම මත ලාභ හෝ පාඩු විකිණීම සිදු කළ කාල පරිච්ඡේදය තුල හඳුනාගන්නා අතර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

ලැබුණු ප්‍රදාන

වියදම් සම්බන්ධයෙන් රජය ප්‍රදාන ලබා දෙන්නේ නම්, එය හිලව් කිරීමට අදහස් කරන පිරිවැයට ගැලපීම සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදය තුල ආදායමක් ලෙස හඳුනා ගනියි.ප්‍රදානය වත්කමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, සාධාරණ අගය විලම්භිත ආදායම් ගිණුමකට බැර කර අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා සමාන වාර්ෂික වාරික මගින් ආදායම් ප්‍රකාශයට නිදහස් කරනු ලැබේ.

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් වශයෙන් හඳුනාගෙන වසර **10**ක කාලසීමාවක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

ලැබුණු පුනරාවර්තන ප්‍රදාන

ආදායම් සම්බන්ධ ප්‍රදාන 'වෙනත් ආදායම්' වශයෙන් වෙනමම වාර්තා කිරීම හෝ අදාළ වියදම්වන් අඩු කිරීම කරනු ලැබේ.

2.4.14 වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගනිමින් ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලැබේ. ව්‍යාපාර කටයුතු තුළදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී උද්ගත වන සියළු වියදම් ආදායම් ප්‍රකාශයට ආරෝපණය කර ඇත.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සමාගමේ සහ සමූහයේ කාර්ය සාධනයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන පදනම මත, "වියදම් ශ්‍රිත" ක්‍රමය අනුගමනය කර ඇත.

අ) පුනරාවර්තන වියදම්

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් උපයා ඇති ලාභය සියළුම ප්‍රකාශිත වගකීම් සඳහා සහ දේපළ පිරියත සහ උපකරණ ක්ෂය සඳහා වෙන් කිරීම් කළ පසුව ඉපයූ ලාභ වේ.

ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීමේ අරමුණින් ස්ථීර ස්වභාවයේ වත්කම් පුළුල් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත.

2.4.15 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය ඒවා දරණ ලද වර්ෂය තුලදී වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

2.4.16 බැඳීම් සහ අවිනිශ්චිතතා

අවිනිශ්චිතතා යනු අතීත සිද්ධින් මගින් පැන නගින ලද සහ මණ්ඩලයේ පාලනයෙන් බැහැර අනාගත අවිනිශ්චිත සිද්ධියක් ඇති වීම හෝ ඇති නොවීම මත පමණක් නිශ්චය කරගනු ලබන විභව්‍ය වත්කම් හෝ බැඳීම් වේ.

2.4.17 ශේෂ පත්‍ර දිනට පසුව පැන නගින සිද්ධින්

සියළුම වැදගත් ශේෂ පත්‍ර පසු සිද්ධින් අදාළ අවස්ථාවන්හි දී හෙළිදරව් කර ගළපා ඇතැයි යනුවෙන් සළකා ඇත.

3. ආදායම	**2021**	**2020**
	රු.	රු.
ප්‍රදර්ශනාගාරවල අලෙවිය		
තුම්මුල්ල	53,131,642	79,691,725
කෞතුකාගාරය	6,117,605	19,175,538
ගාල්ල	9,350,552	19,452,867
පේරාදෙණිය	6,432,911	16,075,609
කටුනායක	6,742,306	11,240,568
කොටුව	9,736,767	10,143,012
වැලිපැන්න 1	4,465,532	11,152,021
බත්තරමුල්ල	3,719,753	5,698,666
මහනුවර	3,320,564	8,247,892
කටුබැද්ද	4,318,325	5,017,082
පින්නවල	2,067,206	4,178,202
නුවරඑළිය	1,343,977	1,818,842
මුළු ප්‍රදර්ශනාගාර විකුණුම්	110,747,140	191,892,024
සෘජු/පාරිභෝගික රුචිය අනුව කළ ඇණවුම්	26,748,695	2,847,980
	137,495,835	**194,740,004**

4. වෙනත් ආදායම්	**2021**	**2020**
	රු.	රු.
කුලී ආදායම	3,910,627	5,883,099
ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම	25,340,004	
ඉතුරුම් ගිණුමේ පොලී	66,412	81,044
විදේශ විනිමය ලාභය	75,707	854,669
	29,392,750	**6,818,812**

5. පරිපාලන වියදම්	සටහන්	**2021**		**2020**
		රු.		රු.
වැටුප් සහ දීමනා		66,552,828		69,534,613
දිරි දීමනාව		96,000		-
ඊ.පී.එෆ්. සහ ඊ.ටී.එෆ්. (E.P.F. & E.T.F.)		9,593,951		9,886,048
පාරිතෝෂිකය		3,682,500		7,129,839
ප්‍රවාහන දීමනාව		5,276,175		4,965,599
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ මණ්ඩල රැස්වීම් වියදම්		467,482		548,939
විගණන ගාස්තු/වෘත්තීය ගාස්තු		1,219,200		1,410,000
නීති ගාස්තු		155,000		135,800
ආරක්ෂක ගාස්තු		5,399,593		11,184,146
කුලී සහ වරිපනම්		12,056,104		16,467,874
විදුලිය		7,741,522		10,687,551
ක්ෂය වීම්		26,440,306		26,414,467
ගොඩනැගිලි සංවර්ධන ක්‍රමක්ෂ කිරීම්		25,590,164		
පිරිසිදු කිරීමේ සේවා		4,911,651		4,927,744
අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය *	**5.1**	3,946,858		3,810,173
වෙනත් මෙහෙයුම් පිරිවැය *	**5.2**	13,941,628		21,518,789
			187,070,962	

උප සටහන 5.1

අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය යටතේ ඇතුළත් වේ *	**2021**		**2020**
	රු.		රු.
අතිකාල	283,127		-
සේවක සුබසාධක	1,743,422		2,582,908
මුදල් ආරක්ෂණ පොලී	214,999		212,241
කාර්යමණ්ඩල පුහුණුව	-		29,000
වෛද්‍ය වියදම්	1,705,310		986,024
VRS	-		-
		3,946,858	

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

උප සටහන 5.2	**2021**		**2020**	
වෙනත් මෙහෙයුම් පිරිවැය යටතේ ඇතුළත් වේ *	රු.		රු.	
වෙළඳ දැන්වීම්	564,365		324,924	
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	1,032,132		1,146,501	
පුවත් පත් සහ වාර ප්‍රකාශන	-		7,590	
තැපැල් ගාස්තු/දුරකථන/ටෙලෙක්ස්	9,070,246		11,029,945	
ඉන්ධන සහ ලිහිසි තෙල්	704,042		595,729	
තොග සත්‍යාපනය	175,374		210,356	
වෙළඳ බලපත්‍ර ගාස්තු	-		252,720	
පරිගණක වියදම්	260,890		170,005	
රක්ෂණය	55,764		278,607	
ජල බිල්පත	337,721		368,221	
අලුත්වැඩියාව සහ නඩත්තුව - ගොඩනැගිලි	1,246,317		1,322,226	
අලුත්වැඩියාව සහ නඩත්තුව - යන්ත්‍රෝපකරණ	223,081		1,272,935	
වාහන කුලියට දීමේ ගාස්තු	-		3,025,968	
ප්‍රදාන සහ ගොඩනැගිලි ක්‍රමක්ෂ කිරීම-ශුද්ධ වෙනස			260,365	
සහන ගාස්තු	266,571		1,197,707	
විවෘත කිරීමේ උත්සව වියදම්	-		49,734	
මුද්දර ගාස්තු	5,125		5,256	
		13,941,628		**21,518,789**

6. බෙදාහැරීමේ වියදම් සටහන්	**2021**	**2020**
	රු.	රු.
උපදේශක කොමිස්	2,146,897	12,089,387
ක්‍රෙඩිට් කාඩ් කොමිස්	1,386,182	2,415,398
ඇසුරුම් ද්‍රව්‍ය දේශීය	749,333	1,157,820
ව්‍යාපාර ප්‍රවර්ධනය	557,062	356,236
අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම භාණ්ඩ මිලදී ගැනීම	114,993	102,760
ප්‍රදර්ශනය සහ වෙළඳ ප්‍රදර්ශනය	868,000	-
භාණ්ඩ ප්‍රවාහනය	-	79,300
ගමන් වියදම්	1,144,457	1,038,372
තක්සේරු වියදම්	1,010,149	77,420
රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු	171,103	161,511
විශේෂ ඇණවුම් වියදම්	91,483	356,535
	8,239,659	**17,834,739**

	2021	**2020**
	රු.	රු.
7. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	111,752	148,333
ණය පොලී - ලංකා බැංකුව	26,703,053	27,033,067
- ප්‍රා.ස.බැ.	15,235,566	9,823,585
	42,050,371	**37,004,985**

8. බදු

මෙහි දැක්වෙන ගෙවිය යුතු මුදල් පෙර වසරවල එකතු වූ ඒවා වන අතර ඒවා මණ්ඩලය විසින් මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පියවා නැත. 2020 වසරේ සිට, බදු නීතිවලට අනුකූල වීම සඳහා මණ්ඩලය ක්‍රමානුකූලව බදු ගෙවීම් ආරම්භ කර ඇත

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

09. දේපල, පිරියත සහ උපකරණ

	සටහන්	2021	2020
		රු.	රු.
සින්නක්කර වත්කම්	**9.1**	656,565,972	698,222,588
ගොඩනැගිලි සංවර්ධන පිරිවැය	**9.2**	173,029,950	198,897,809
		829,595,922	**897,120,397**

9.1 සින්නක්කර වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	පිරියත සහ යන්ත්‍රෝපකරණ	ගෘහභාණ්ඩ උපාංග සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	ලිපි	මෘදුකාංග	සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය හෝ තක්සේරුව									
2020 ජනවාරි 1 දිනට ශේෂය	396,037,214	248,797,761	100,796,761	60,158,229	33,337,166	32,543,373	-	45,451,390	**917,121,895**
එකතු කිරීම්		-	110,730	21,500	75,150	855,985	-	-	**1,063,365**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**396,037,214**	**248,797,761**	**100,907,491**	**60,179,729**	**33,412,316**	**33,399,358**	**-**	**45,451,390**	**918,185,259**
ගැලපීම්	(15,248,575)				(10,193,250)		10,193,250		**(15,248,575)**
එකතු කිරීම්	-	-	-	-	-	32,265	-	-	**32,265**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**380,788,639**	**248,797,761**	**100,907,491**	**60,179,729**	**23,219,066**	**33,431,623**	**10,193,250**	**45,451,390**	**902,968,949**
ක්ෂය වීම්									
2020 ජනවාරි 1 දිනට ශේෂය	-	40,051,629	63,125,827	40,470,927	29,974,352	19,925,470	-	-	**193,548,205**
වර්ෂය සඳහා අය කිරීම්	-	6,203,277	10,089,826	6,016,898	781,157	3,323,308	-		**26,414,466**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		**46,254,906**	**73,215,653**	**46,487,825**	**30,755,509**	**23,248,778**	**-**		**219,962,671**
ගැලපීම්					(10,193,250)		10,193,250		**-**
වර්ෂය සඳහා අය කිරීම්	-	6,203,277	10,090,749	6,017,973	787,923	3,340,384	-		**26,440,306**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**52,458,183**	**83,306,402**	**52,505,798**	**21,350,182**	**26,589,162**	**10,193,250**	**-**	**246,402,977**
ඉදිරියටගෙන ආ ප්‍රමාණයන්									
2020 දෙසැම්බර් 31 දිනට	396,037,214	202,542,855	27,691,838	13,691,904	2,656,807	10,150,580	-	45,451,390	698,222,588
2021 දෙසැම්බර් 31 දිනට	**380,788,639**	**196,339,578**	**17,601,089**	**7,673,931**	**1,868,884**	**6,842,461**	**-**	**45,451,390**	**656,565,972**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම්

	2021	2020
පිරිවැය හෝ සලකන ලද පිරිවැය	රු.	රු.
ජනවාරි 1 දිනට ශේෂය	387,252,019	386,446,053
අතිරේක		805,966
* ගලපන ලද	(297,752)	
දෙසැම්බර් 31 දිනට ශේෂය	**386,954,267**	**387,252,019**
ක්‍රමක්ෂය		
ජනවාරි 1 දිනට ශේෂය	188,354,210	162,753,845
වසර සඳහා අය කිරීම	25,590,164	25,600,365
* ගලපන ලද	(20,056)	
දෙසැම්බර් 31 දිනට ශේෂය	**213,924,317**	**188,354,210**
දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ප්‍රමාණයන්	**173,029,950**	**198,897,809**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම් (සම්බන්ධිතයි)

ක්‍රමක්ෂය ස්ථානය	වසර	දරන ලද පිරිවැය	අනුපාතය % දශමස්ථාන දෙකකට	2021 ජනවාරි 01 දිනට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2021 තුළ ක්‍රමක්ෂය	2021 දෙසැම්බර් 31 ට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2021 දෙසැම්බර් 31 දිනට රැගෙන ආ ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රමාණය
කෞතුකාගාරය	2013	172,847,765					
කෞතුකාගාරය	2014	1,881,295					
කෞතුකාගාරය	2015	389,177					
එකතුව		**175,118,237**	5.77%	73,950,197	10,101,214	84,051,411	91,066,826
බත්තරමුල්ල	2013	117,704,905					
බත්තරමුල්ල	2014	7,119,771					
බත්තරමුල්ල	2015	9,744,207					
එකතුව		**134,568,883**	5.77%	55,598,522	7,762,237	63,360,759	71,208,124
පින්නවල	2013	**10,086,000**	10.00%	8,068,800	1,008,600	9,077,400	1,008,600
වාගොල්ල	2014	**810,487**	10.00%	567,340	81,049	648,389	162,098
පේරාදෙණිය	2013	31,657,966					
පේරාදෙණිය	2014	8,968,353					
පේරාදෙණිය	2015	677,220					
එකතුව		**41,303,539**	10.00%	32,010,552	4,130,354	36,140,906	5,162,633
වැලිපැන්න	2013	**10,269,019**	10.00%	8,215,217	1,026,902	9,242,119	1,026,900
තුරහ තරහ පිටිය	2013	**1,113,613**	10.00%	890,887	111,361	1,002,248	111,365
කවුනායක	2013	**1,060,000**	10.00%	848,000	106,000	954,000	106,000
උණවටුන	2013	**1,000,000**	10.00%	800,000	100,000	900,000	100,000
K-Zone	2013	**8,353,071**	10.00%	6,682,453	835,306	7,517,759	835,312
තුන්මුල්ල		**769,781**	10.00%	461,875	76,977	538,852	230,929
මහනුවර	2019	1,993,423		199,342			
	2020	805,966		61,024			
ගලපන ලද	2020	(297,752)		(20,056)			
		2,501,637	10.00%	240,310	250,164	490,474	2,011,163
මුලු එකතුව		**386,954,267**		**188,334,153**	**25,590,164**	**213,924,317**	**173,029,950**

		2021	2020
10. භාණ්ඩ වට්ටෝරු	**සටහන්**	**රු.**	**රු.**
ප්‍රදර්ශනාගාර වෙළඳාම ගුණාත්මයෙන් ඉහළම නිමි භාණ්ඩ		394,180,031	469,284,075
ගුණාත්මයෙන් දෙවන නිමි භාණ්ඩ		150,731,992	148,076,152
අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්	**10.1**	353,927	1,849,358
		545,265,950	**619,209,585**

10.1 අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්

අමුද්‍රව්‍ය සහ ක්‍රියාන්මක වෙමින් පවතින කාර්යයන් පාරිභෝගික රුචිය අනුව සාදන ලද සෘජු ඇණවුම් සඳහා නිෂ්පාදනය කරන ලද අයිතම වලින් සමන්විත වේ..

**SAP පද්ධතියේ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් 2019/2020 වර්ෂයේදී විශේෂ ඇණවුම් වැරදි ලෙස ගිණුම්ගත කර ඇති අතර මෙම දෝෂය 2021 වර්ෂයේදී නිවැරදි කර ඇත.

		2021	2020
11. වෙළඳ සහ අනෙකුත් ලැබීම්	**සටහන්**	**රු.**	**රු.**
වෙළඳ ලැබීම්	**11.1**	27,661,720	8,851,463
අනෙකුත් ලැබීම්	**11.2**	16,000,356	14,605,047
තැන්පතු සහ පෙරගෙවුම්	**11.3**	63,275,967	47,628,507
		106,938,043	**71,085,017**
11.1 වෙළඳ ලැබිය යුතු			
වෙළඳ ණය ගැනියන්		36,827,011	18,343,477
අඩමාණ ණය ගැනියන්	**11.4**	(9,578,372)	(9,578,372)
ලැබිය යුතු ක්‍රෙඩිට් කාඩ		413,081	86,358
		27,661,720	**8,851,463**
11.2 වෙනත් ලැබිය යුතු දේ			
කාර්ය මණ්ඩල ණය		332,500	897,500
ලැබිය යුතු කුලිය		12,562,954	4,625,800
ලැබිය යුතු ESC		3,110,010	9,049,198
ලැබිය යුතු විවිධ		(5,108)	32,549
		16,000,356	**14,605,047**
11.3 තැන්පතු සහ පෙරගෙවුම්			
ආරක්ෂක තැන්පතු		126,022	1,925,446
පෙරගෙවුම්		4,859,893	4,174,854
අත්තිකාරම් ගෙවීම්		35,131,399	20,168,978
රඳවා තබා ගැනීමේ මුදල්		12,502,564	12,502,564
ආපසු ගෙවිය හැකි තැන්පතු		10,836,768	9,037,344
ලැබිය යුතු ඇපකර		(180,679)	(180,679)
		63,275,967	**47,628,507**

11.4 අඩමාණ ණය ගැනියන්

2018 වර්ෂයේදී පැරණි ශේෂයන් සම්බන්ධයෙන් රු.9,578,372/=ක් සඳහා ප්‍රතිපාදන සම්මත කර තිබුණි.

	2021	2020
	රු.	රු.
12. මුදල් සහ මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	37,016,937	27,471,630
අතැති මුදල්	773,210	531,276
	37,790,147	**28,002,906**
ආදායම් සංචිතයේ අනෙකුත් සංරචක		
ආරම්භක ශේෂය	(124,916,200)	(123,528,974)
පෙර වසරේ සංශෝධනය	375,201	(1,387,226)
	(124,540,999)	**(124,916,200)**

ආදායම් සංචිතයේ ඇති අනෙකුත් සංරචක වලට සමුච්චිත ආදායම් සංචිත හරහා ප්‍රත්‍යවේක්ෂණ කර සම්මත කරන ලද පූර්ව කාල පරිච්ඡේදවලට අදාළ සංශෝධන ඇතුළත් වේ.

	2021	2020
	රු.	රු.
13. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		
ආරම්භක ශේෂය	56,203,979	50,896,038
වසර සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	3,682,500	7,129,839
වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය	(1,567,120)	(1,821,898)
2020 දී ගලපන ලද පාරිතෝෂිත ශේෂය	(1,393,899)	
අවසන් ශේෂය	**56,925,460**	**56,203,979**

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බැඳීම සංවිධානයේ සේවකයින් 118ක් ආවරණය වන පරිදි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

14. විලම්බිත ආදායම

දීමනාව පිළිබඳ විස්තරය	වසර	ක්‍රමක්ෂය වීමේ අනුපාතය	ලැබී ඇති මුල් දීමනාව	**2020** දෙසැම්බර් **31** දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය	**2021** තුළ ක්‍රමක්ෂ කළ මුදල	**2021** දෙසැම්බර් **31** දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය
ආර්ථික සංවර්ධන	**2012**	10%	100,000,000	10,000,000	10,000,000	-
වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	**2013**	10%	36,000,000	7,200,000	3,600,000	**3,600,000**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	10,224,643	2,044,929	1,022,464	**1,022,465**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	42,109,637	12,632,890	4,210,964	**8,421,926**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	11,099,920	2,219,984	1,109,992	**1,109,992**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	7,828,426	1,565,687	782,843	**782,844**
ආර්ථික සංවර්ධන	**2014**	10%	35,000,000	10,500,000	3,500,000	**7,000,000**
අයවැය ප්‍රතිපාදන	**2014**	10%	11,137,374	3,341,223	1,113,737	**2,227,486**
එකතුව			**253,400,000**	**49,504,713**	**25,340,000**	**24,164,713**

	2021	2020
	රු.	රු.
15. දිගුකාලීන ණය ගැනීම්		
ආරම්භක ශේෂය	439,723,409	431,726,929
වර්ෂය තුළ ලබාගත් ණය	78,964,206	8,323,585
වසර තුළ ගෙවූ ණය	(41,101,385)	(327,105)
අවසන් ශේෂය	477,586,230	439,723,409
(අඩු කළා) වසරක් ඇතුළත ගෙවිය යුතු	(93,804,348)	(54,444,000)
දිගුකාලීන ණය බැඳීම්	**383,781,882**	**385,279,409**

15.1 ලංකා බැංකුව - 2020 අවසන් වන විට ණය ශේෂය රුපියල් මිලියන 273

ආරම්භයේ දී කොටුව ගොඩනැගිල්ල උකස් කර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 950 කට 2012 සිට 2018 දක්වා කාලය තුළ ණය ලබා ගන්නා ලදී. ලබාගත් ණය මුදලින් ප්‍රදර්ශනාගාර වැඩි දියුණු කරන අතරම, ලක්සල ණය ගෙවීම් සඳහා ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ලබා ගත්තේය. අවසානයේ ප්‍රාග්ධන ණය ප්‍රමාණය පියවූ අතර 2013 වසරේ සිට 2019 දක්වා ලංකා බැංකු ණය රුපියල් මිලියන 273 දක්වා අඩු කෙරිණි. නමුත් රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් 2020 වසරේ සිට 2021 වසර දක්වා ප්‍රාග්ධනය සහ පොලී පියවීමට ලක්සලට නොහැකි විය. ඒ නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදුන් පරිදි 2020 සහ 2021 වසර වලදී පමා සහන රැසක් ලබා දී ලංකා බැංකුවේ නොගෙවූ මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 306ක් බවට පත් කෙරිණි.

15.2 2021 මුදල් වර්ෂය තුළ දැනට පවතින ණය 3 සඳහා අමතර පමා සහන හයක් ලබා දෙන ලදී.

2020 ලංකා බැංකුවේ ණය ශේෂය	රු. මී. 273
2021 ලංකා බැංකුවේ පොලී සහ ප්‍රාග්ධනය	රු. මී. 33
ලංකා බැංකුවේ මුළු ණය ශේෂය	රු. මී. 306

15.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රු.මී.200

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා 2013 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කැලණිය ශාඛාවෙන් රුපියල් මිලියන 200ක පහසුකමක් ලබා ගන්නා ලදී. මහා භාණ්ඩාගාරය බැංකුව හරහා ණය පහසුකම් සලසා දී ඇති බැවින් ලක්සල ආයතනයෙන් කිසිදු ඇපයක් ලබා දී නොමැත. 2021 වර්ෂයේදී COVID-19 නිසා ඇති වූ මූල්‍ය තත්ත්වය හේතුවෙන් ලක්සලට ගෙවීමට නොහැකි වූ රුපියල් මිලියන 12.9 ක පොලිය ප්‍රාග්ධනීකරණය කරන ලදී.

	2021	2020
	රු.	රු.
16. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ		
වෙළඳ ගෙවිය යුතු	290,919,988	334,334,840
වෙනත් ගෙවිය යුතු	119,436,360	112,410,635
උපචිත වියදම්	71,917,604	75,811,084
	482,273,952	**522,556,559**

	2021	2020
	රු.	රු.
17. කෙටි කාලීන ණය ගැනීම්		
දිගුකාලීන ණය බැඳීම්වල වත්මන් කොටස	93,804,348	54,444,000
කෙටි කාලීන ණය	7,415,524	14,652,784
	101,219,872	**69,096,784**

	2021	2020
	රු.	රු.
18. බැංකු අයිරා		
බැංකු අයිරා	**986,112**	**5,353,692**

රුපියල් 986,112.00 (2020: රුපියල් 5,353,692.00) බැංකු අයිරාව වසර අවසාන වන විට මුදල් පොතේ දිස්වන ශේෂයයි. මූල්‍ය වර්ෂයේ ලංකා බැංකුවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ රුපියල් මිලියන 15ක අයිරා පහසුකම සඳහා බැංකුව විසින් අනුමැතිය ලබා දෙන ලදී..

19. අවිනිශ්චිත වගකීම් සහ කැපවීම්

මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු:

උසාවි අංක	නඩුව ගොනු කළේ:	නඩුව ගොනු කරනු ලැබුවේ	නඩුවේ ස්වභාවය	වත්මන් තත්ත්වය
DMR/0280/13	15/07/13	කෝට්ටේ මහ නගර සභාව	සූර්ය පැනල සවිකිරීමේ කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව කෝට්ටේ මහ නගර සභාව විසින් දිසා අධිකරණයේ ගොනුකළ නඩු	රු. 4,020,000ක් පොලිය සමඟ කෝට්ටේ මහ නගර සභාවට ගෙවීමට තීරණය විය. කෙසේ වෙතත් මෙම නඩුවට අදාළව ලක්සල ආයතනය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අධිකරණ නීන්දුව ලබා දුන් බැවින්, 2021 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදලට සමාන මුදලක් ලබා දෙන ලදී.
DMR/2255/16	16/05/09	ඩිමෝ පුද්. සමාගම	ඉතිරි මුදල් නොගෙවා කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව ඩිමෝ විසින් දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු.	නිරණය තවමත් ලබා දී නොමැති අතර 2021 දෙසැම්බර් 31 වන දිනට කිසිදු සසම්භාවී බැඳීමක් නොපවතී.
138/2018/MR	18/03/08	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලක්සල විසින් සංචාරක මණ්ඩලයෙන් ලබාගෙන JAT හෝල්ඩිංග්ස් වෙත උප කොන්ත්‍රාත්තුවක් ලබා දී ගෙවීමට ඇති රු. 8,184,683.49 ක ගෙවීමක් සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලද නඩු.	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.
139/2018/MR	18/04/10	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වැනි මහලේ පිහිටි බේරුම්කරණ මධ්‍යස්ථානය (Arbitration centre) ප්‍රතිසංස්කරණය කිරීමට ලක්සල අධිකරණ අමාත්‍යාංශය සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත. ලක්සල මෙය JAT හෝල්ඩිංග්ස් සමාගමට උප කොන්ත්‍රාත්තුවක් මඟින් ලබා දී තිබූ අතර වැඩ අවසන් කර ඇත. නමුත් අධිකරණ අමාත්‍යාංශය JATහෝල්ඩිංග්ස් වෙත ගෙවිය යුතු ඉතිරි මුදල් පියවා නිබුණේ නැත. එබැවින් රුපියල් 32,256,980 ක මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව JAT හෝල්ඩිංග්ස් විසින් කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා ඇත.	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.

අභ්‍යන්තර විමර්ශන
2015 වසරේ වැඩ තහනම් කර ඇති ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව අභ්‍යන්තර විමර්ශන පැවැත්විණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය තවම ලබා දී නොමැත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/B/ SLHB /204/FA/2021 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 දෙසැම්බර් 06 දින

සභාපති

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 69 වගන්තිය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස හඳුනාගත යුත්තේ වගකීම වාර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් ඇතුලත නිරවුල් කිරීමට නියමිත සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී නිරවුල් කිරීමට අපේක්ෂා කරන වගකීම් සඳහා පමණි. එසේ වුවද, ජංගම වගකීම් ලෙස දක්වා ඇති රු.290,919,988ක් වූ වෙළඳ ණය හිමියෝ හා රු.119,436,360ක් වූ වෙනත් ණයහිමි ශේෂය තුල වර්ෂ 2ක සිට වර්ෂ 5ක් දක්වා කාල පරාසයක් තුල අයවිය යුතු රු.135,406,440ක ශේෂයක් හා වර්ෂ 5ක් ඉක්ම වූ රු.168,912,845ක ශේෂ විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් වලින් සියයට 9.8ක් වූ දෙවන ගුණත්වයේ තොග ලෙස අළුත්වැඩියා කලයුතු සහ ක්‍රියාකාරී නොවන තොග වශයෙන් රු. 150,731,992ක් වූ අතර, එම හේතුවෙන් තොගවල සත්‍ය වටිනාකම් නිරූපණය නොවන බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 28 වගන්තිය ප්‍රකාරව තොග ආගණනය ශුද්ධ උපලබ්ධි අගයට පෙන්නුම් කර නොතිබීම හේතුවෙන් අවසන් තොගය අධි තක්සේරු වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 34 වගන්තිය ප්‍රකාරව තොග සම්බන්ධ සියළු අලාභයන් ලියාහැරීම හෝ අලාභ සිදු වූ කාලපරිච්ඡේදය තුළ වියදමක් සේ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, මණ්ඩලයේ හානි තොග ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.3,486,004ක සමුච්චිත හානි තොගය පොත් වලින් ඉවත්කිරීම වෙනුවට හානි වූ තොග වත්කම් ලෙස පොත් වල ඉදිරියට ගෙනඒම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල තොග වටිනාකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) කොටුව ලක්සල ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා නඩු කටයුත්තක් හේතුවෙන් 2014 වර්ෂයේ දී ඒ සඳහා දරන ලද රු.45,451,390ක මුදල 2021 වර්ෂය දක්වාම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. මෙම වටිනාකම් තුල ඇතුලත් වියදම් හා වත්කම් කොටස වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වෙළඳ හා වෙනත් ණයහිමි ශේෂ තුල රු.74,917,550 ක හර ශේෂ ඇතුලත් වූයෙන් එම වටිනාකමින් ණයහිමි ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පරිගණක උපාංග ශේෂය තුල ඇතුලත් රු.19,279,453ක් වූ පරිගණක උපාංග සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර භාවිතයේ පවතින පරිගණක උපාංග නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමට හා භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින පරිගණක උපාංග භෞතිකව හඳුනාගෙන අපහරණය කොට පොත් වලින් කපා හැරීමට පියවර ගෙන නොතිබුණි.

(උ) 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.19,429,671 ක් වූ ශේෂය සම්බන්ධයෙන් ශේෂ සනාථ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2012 වර්ෂයේ ආරම්භක ශේෂයක් ලෙස නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට එමින් පවතින හඳුනා නොගත් රු.12,002,564ක රැඳවුම් මුදල් ශේෂය සනාථ කරගැනීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීය.

(එ) උපචිත වියදම් තුල ඇතුලත් රු.6,546,541 ක් වූ වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් දේපල පිරියත වර්ග 4ක්, වත්කම් භෞතික සත්‍යාපන වාර්තා සමඟ සැසඳීමේදී රු.132,389,269ක වෙනසක් නිරීක්ෂණය විය. පසුගිය වසර වලදී ද විගණනය මඟින් පෙන්වා දී ඇති මෙම වෙනස්කම් හඳුනාගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඔ) සමාලෝචිත වසරේ මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයේ ක්‍රියාකාරී තොග වටිනාකම රු.390,694,024 ක් වුවද, භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව තොග වටිනාකම රු.389,284,437ක් වුයෙන් වාර්තාගත වටිනාකම් අතර රු.1,409,590ක වෙනසක් පැවතුණි.

(ඕ) 2014 වර්ෂයේ සිට පැවත එන ක්‍රියාකාරී තොග වටිනාකම තුළ අන්තර්ගත වූ මාර්ගස්ථ තොග ගිණුමේ වටිනාකම රු.6,291,571ක් වූ අතර එහි පවත්නා ශේෂ කාලීනව සසඳා නිවැරදි තොග වටිනාකම නිරවුල් නොකිරීම හේතුවෙන් සත්‍ය වශයෙන් නොපවතින තොග වටිනාකමක් ගිණුම්වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ , තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු

කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ (අ),(ඇ),(උ),(උෟ),(එ),(ඒ),(ඔ),(ඕ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයටයොමුව	විස්තරය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 වගන්තියෙන් සංශෝධිත i. මුදල් රෙගුලාසි 371 (5)	කාර්යය නිමකර දින 10ක් තුළ අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, මණ්ඩලයේ සේවකයින් ලබාගෙන තිබූ වසර 2ට අඩු රු.708,818ක විවිධ අත්තිකාරම් මුදල් මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාලව මණ්ඩලයේ විවිධ අංශ හා නිලධාරීන්/සේවකයින් වෙත නිකුත් කළ රු.17,589,311ක වෙළඳ/වෙළඳ නොවන ගැනුම් අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.
	ii. මුදල් රෙගුලාසි 371 (2) (අ)	එදිනෙදා සුළු වියදම් දැරීම සඳහා මාණ්ඩලික නිලධාරියකුගේ සෘජු අධීක්ෂණය යටතේ සුළු වියදම් සඳහා රු.25,000ක උපරිමයක් දක්වා සුළු මුදල් අතුරු අග්‍රිමයක් නිකුත් කලහැකි වුවද ප්‍රදර්ශනාගාර 9 කට හා ප්‍රධාන කාර්යාලයේ අංශ 2 කට එම සීමාව ඉක්මවා සුළු මුදල් අග්‍රිම නිකුත් කර තිබුණි.
(ආ)	ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 23 ඡේදය	මණ්ඩලයේ සිදු වී ඇති දූෂණ සම්බන්ධයෙන් පවත්වා ඇති මූලික විමර්ශන වලදී අනාවරණය වී ඇති කරුණු අනුව නිලධාරීනියන් දෙදෙනකු විසින් සිදුකර ඇති විෂමාචාර හේතුවෙන් 2015 නොවැම්බර්

		24 දින සිට රාජකාරී වැඩ තාවකාලිකව නතර කර තිබුණි. 2015 දෙසැම්බර් 23 දින මෙම නිලධාරීන් වෙත චෝදනා පත්‍ර නිකුත් කර නැවත 2016 ජනවාරී 11, 2016 ජූනි 21 හා 2016 ජූනි 06 සංශෝධිත චෝදනා පත්‍ර නිකුත් කර තිබුණි. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණ 2020 පෙබරවාරි හා 2019 දෙසැම්බර් මාස වලදී අවසන් කර ඇතත් විනය නියෝග 2022 ඔක්තෝබර් දක්වා නිකුත් කර නොතිබුණි
(ඇ)	2003 ඔක්තෝබර් 28 දිනැති PED 17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	2021 ඔක්තෝබර් මස සිට 2022 මාර්තු 31 දක්වා පවත්වන ලද ඩුබායි එක්ස්පෝ 2021/2022 ජාත්‍යන්තර අලෙවි ප්‍රදර්ශනය සඳහා ලක්සල නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් විදේශ සංචාරය සඳහා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර, නිලධාරීන් විසින් රු.1,219,480ක විදේශ ගමන් දීමනා හා ඒ ආශ්‍රිත වියදම් ලබාගෙන තිබුණි.
(ඈ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III කොටසේ 16 (2) වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය	කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 06ක් ප්‍රමාද වී 2022 සැප්තැම්බර් 22 දින ඉදිරිපත් කර තිබුණ ද කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) මණ්ඩලය විසින් 2021 සිට 2023 කාලපරිච්ඡේදයට අදාලව සකසා තිබූ ව්‍යාපාර සැලැස්මට අනුව 2021 වසරට අදාලව රු. මිලියන 435ක ඉලක්කගත විකුණුම් ආදායමක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණ ද, 2021 වසර තුල මණ්ඩලය මඟින් උපයා තිබූ තත්‍ය ආදායම රු.මිලියන 137ක් වූයෙන් ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 31 ක ආදායමක් පමණක් උපයා තිබුණි. අලෙවි ආදායම ඉහළ නැංවීමේ අරමුණින් 2021 වර්ෂය තුල මණ්ඩලය විසින් වරලත් විදේශීය අලෙවි නියෝජිත ගිවිසුම් හතකට එළඹ තිබුණද, එම ගිවිසුම් ප්‍රකාරව ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් අලෙවිසැලක් විවෘත කර තිබූ අතර, 2021 අගෝස්තු 06 දින වරලත් අලෙවි නියෝජිත වෙත පිරිවැය රු 15,483,376 ක් වූ භාණ්ඩ යවා තිබුණි. අලෙවි නියෝජිත සමඟ ඇති කරගත් ගිවිසුමේ 05.4.1 වගන්තිය ප්‍රකාරව ආදායම් කොටස බෙදාගැනීම, පළමු වසර තුන තුළ මාසයක් තුල උපයන විකුණුම් ආදායම එක්සත් ජනපද ඩොලර් 50,000 හෝ ඊට වැඩි නම් මාසයකට සියයට තුනක ආදායම් ප්‍රතිශතයක් මණ්ඩලයට ලබාදිය යුතු බවට එකඟ වී තිබුණද මෙම වාර්තාවේ දින විටත් එම මුදල ලැබී නොතිබූ අතර ලද භාණ්ඩ වල විකුණුම් මිල වූ රු.19,889,698ක මුදලට ලබාදී තිබූ බැංකු සුරක්ෂණය මුදල් කර විකුණුම් මිල පමණක් පියවාගෙන තිබුණි. මණ්ඩලයේ දේශීය විකුණුම් වලට අදාලව උපයන ලාභ ආන්තිකය සියයට 50 සිට සියයට 73 දක්වා පරාසයක තිබුණද, විදේශ වරලත් අලෙවිසැල් (ෆැන්චයිස්) විකුණුම් මඟින් උපයා තිබූ ලාභ ආන්තිකය සියයට 22 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි.

(ආ) මණ්ඩලයේ ආදායම ඉහළ නංවා ගැනීමේ අරමුණින් 2021 වර්ෂයේ සිට මාර්ගගත විකුණුම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර තිබූ අතර, 2021 වසර තුල එමඟින් රු.769,513 ක ආදායමක් පමණක් උපයා තිබුණද දැනට එම ක්‍රමවේදය ක්‍රියා විරහිතව පවති. වර්තමානය වන විට මාර්ගගත මිලදී ගැනීම් සඳහා ජනතාවගේ වැඩි නැඹුරුවීමක් ඇති තත්වයක මණ්ඩලය විසින් පුළුල් ප්‍රචාරණයක් තුලින් අලෙවි අවස්ථා ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2022 වර්ෂයේ සැප්තැම්බර් දක්වා රු.37,856ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි.

(ඇ) 2020 ක්‍රියාකාරි සැලැස්ම තුළ කල් ඉකුත් වීමට ආසන්න සහ සෙමෙන් වලනය වන තොග කල්තියා හඳුනාගෙන විශේෂ වට්ටම් ලබා දෙමින් ඒවා මුදල් බවට පත්කිරීමට යෝජනා වී තිබුණි. එසේවුවද, රු.9,455,546ක් වටිනා මැණික් හා ස්වර්ණාභරණ තොග 2011 වසරේ සිට විකිනීමකින් තොරව නෂ්ට වෙමින් පවතින අතර, මෙම තොග සඳහා රු.8,102,312 ක් එකී කාලපරිච්ඡේද වලදී සැපයුම්කරුවන්ට ගෙවීම්ද කර තිබුණි.

(ඈ) 2018 මාර්තු 28 හා 2018 සැප්තැම්බර් 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්වේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS 1702 හා DMS 1702/V01 – III ලිපි මඟින් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරගෙන තිබුණ ද ඊට අනුකූලව කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීම ක්‍රියාත්මක කර නොතිබුණි. 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව නව වැටුප් ක්‍රමය අනුව වැටුප පරිවර්තනය කිරීමට පෙර අදාල සියළු තනතුරු ඒ ඒ සේවා ගණනයන්ට හා වැටුප් පරිමාණයන්ට ඇතුලත් වන සේ ගලපා සකසනු ලබන යෝජනා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට අනුකූලතා සහතිකයක් ලබාගෙන නොතිබූ අතර, ඒ හේතුවෙන් අන්තර්ග්‍රහණයෙන් පසුව වැඩිවිය හැකි වැටුප් ප්‍රමාණයන් පිළිබඳව නොදැන, අන්තර්ග්‍රහණය කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ හේතුවෙන් අනුමත කාර්යමණ්ඩලය තුල ඇතුලත් ඉහළ වැටුප් පරිමාණයන් සහිත තනතුරු වල පුරප්පාඩු තිබියදී සේවකයින් බහුතරයක් පහළ වැටුප් පරිමාණයන් වල පිහිටුවා තිබීමෙන් උසස් වීම් ද කළමනාකරණය විසින් අහිමි කර තිබුණි.

(ඉ) හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා 2012 – 2018 කාලය තුලදී ලංකා බැංකුවෙන් ලබාගත් රුපියල් මිලියන 950ක ණය මුදලෙන් 2019 වර්ෂය අවසානය වන විට ශේෂව පැවති මිලියන 273ක ශේෂය, 2020 වර්ෂයේ නව ණය මුදල් 3ක් ලෙස ප්‍රතිලේඛණගත කර තිබුණු අතර, ඊට ගෙවිය යුතුව තිබූ ණය වාරික සහ පොලී නොගෙවීම හේතුවෙන් ණය මුදල හා පොලීයද සමග 2021 වර්ෂයේ සිට නව ණය මුදල් 9 ක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබුණි. මේ හේතුවෙන් 2021 වර්ෂය අවසාන වන විට මුළු ණය ප්‍රමාණය රු.306,276,632ක් දක්වා සියයට 12 කින් වර්ධනය වී තිබුණි. මෙම ණය මුදල් සඳහා 2021 වර්ෂය සඳහා ගෙවිය යුතු රු.9,875,272 ක් වූ ගෙවිය යුතු ණය පොලී මුදල් මේ දක්වාම ගෙවා නොතිබුණි.

(ඊ) ව්‍යාපාරික වශයෙන් කේන්ද්‍රීය ස්ථානයක පිහිටි ඉහළ වාණිජ වටිනාකමකින් යුතු වර්ග අඩි 44,000ක් වූ කොළඹ කොටුව ලක්සල සිව්මහල් ගොඩනැගිල්ල 2013 වර්ෂයේ දී නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ICTAD ආයතනයේ ලියාපදිංචිය නොමැති කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණද, 2014 වර්ෂයේ දී නවීකරණ කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. ICTAD ආයතනයේ වාර්තාවට අනුව කොන්ත්‍රාත්කරුවෙත ගෙවා ඇති මුදලින් සිදුකර ඇති භෞතික වැඩ වටිනාකම අඩුකළ පසු තවදුරටත් කොන්ත්‍රාත්කරු භාරයේ පවතින හස්ත කර්මාන්ත මණ්ඩලයට අයවිය යුතු රුපියල් මිලියන 30ක මුදල අයකර ගැනීමටගෙන ඇති නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි.මින් වර්ග අඩි 1200ක භූමි ප්‍රමාණයක පමණක් කොටුව ලක්සල ප්‍රදර්ශනාගාරය පවත්වාගෙන යනු ලබන අතර වර්ෂ කීපයක සිට මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට නොහැකිව නිෂ්කාර්යව පැවතුනි. මණ්ඩලය සතු පර්චස් 60ක් පමණ වූ මෙම කොළඹ කොටුව ඉඩම හා පර්චස් 22ක් පමණ වූ ගාල්ල ඉඩම පවතින ආර්ථික වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා මහ බැංකුවේ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම හරහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත 2013 වර්ෂයේ දී රුපියල් මිලියන 200 ක ණය මුදලක් වාරික 2ක් යටතේ ප්‍රදානය කර තිබුණි. මෙම ණය මුදල 2020 දෙසැම්බර් 31 දින වන විට එය රු.158,399,824 දක්වා අඩු වී තිබුණි. නමුත් 2020 වර්ෂයේ පොලී නොගෙවීම මත පොලී මුදල රු.8,323,585ක් හා 2021 මාර්තු මාසය දක්වා පොලී මුදල රු.4,586,188ක් වශයෙන් රු.12,909,773ක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන විට මුළු ණය මුදල රු.171,309,597ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේම 2021 වර්ෂය සඳහා ණය වාරික හා පොලී මුදල් වශයෙන් රු.21,796,529ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 1990 වර්ෂයේ පිහිටුවන ලද ශිල්පීන්ගේ සුභසාධන සංවර්ධන අරමුදලේ ව්‍යවස්ථා රෙගුලාසි ප්‍රකාරව ශිල්පීය සුභසාධනය වෙනුවෙන් Benevolent Fund නමින් පවත්වාගෙන ගිය අරමුදලේ 2021 දෙසැම්බර් 31 දක්වා රු.5,023,891 මුදලක් එකතු වී ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම අරමුදල ශිල්ප සභාව වෙත පැවරීමට 2007 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද මේ දක්වා එම පැවරීම නොකොට රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක නිශ්කාර්යව පැවතුණි.

(එ) හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් කරනු ලබන බාහිර කොන්ත්‍රාත් වැඩ සඳහා ඉදිරිපත් කළ යුතු ඇප තැන්පතු සඳහා මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් වර්ෂ 10කට වැඩි කාලයක සිට පවත්වා ගෙන ගොස් තිබූ අතර, 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,249,872ක් විය. එම ගිණුම සඳහා සියයට 3ක් වැනි සුළු පොලී ප්‍රතිශතයක් ලැබී තිබූ අතර 2021 වර්ෂයේ පොලී මුදල් වශයෙන් රු.66,412ක් බැංකුව විසින් ඉතිරි කිරීමේ ශේෂයට එකතු කර තිබුණි. මණ්ඩලය විසින්

බාහිර වැඩක් හෝ කොන්ත්‍රාත්තුවක් සිදුකරන අවස්ථාවේ දී අවශ්‍ය වන ඇප මුදල් අවස්ථානුකූලව තැන්පත් නොකර මෙලෙස විශාල මුදලක් ඉතිරි කිරීමේ ගිණුමේ රඳවා තිබීම තුලින් විශාල පොලී ආදායමක් අහිමිවී තිබුණි.

(ඒ) මහජන බැංකුවේ නුවරඑළිය ශාඛාවේ පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුමේ 2013 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.85,587ක් වූ අතර, 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.4,785,163ක් විය. මෙසේ ජංගම ගිණුමක් තුල මුදල් තැන්පත් කිරීම තුල ආර්ථික වාසියක් නොලැබෙන අතර උග්‍ර අරමුදල් අර්බුදයකට පත්ව ඇති මණ්ඩලය මෙම මුදල් ඵලදායී ආයෝජනයක් සඳහා හෝ එදිනෙදා මූල්‍ය අවශ්‍යතා සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 කොටසේ 9 වගන්තියෙන් සංශෝධිත මු.රෙ 880 විධිවිධානයන්ට අනුව ඇප තැබිය යුතු සියලුම රාජ්‍ය නිලධාරීන් එම මුදල් රෙගුලාසි අනුගමනය කරමින් ඇප තැබීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඇප තබන ලද නිලධාරීන්ගෙන් අයකරන ලද සේවක ඇප මුදල් අදාල නිලධාරියා නමින් ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් නොකොට ඊට පටහැනිව රු.2,410,000 ක මුදලක් මණ්ඩලයේ ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි. එම මුදලට පොලී මුදලක් මණ්ඩලය වෙත ලැබී නොතිබුණු නමුත් අදාල නිලධාරියා වෙත ගෙවිය යුතු පොලී මුදල් මණ්ඩලය විසින් ගණනය කර ගෙවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.1,289,567ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඕ) අලෙවිය ප්‍රවර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් මණ්ඩලය සතු ගොඩනැගිලි වල ව්‍යාපාර කටයුතු කිරීම සඳහා බාහිර ආයතන 7ක් සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර ආයතන 02 පමණක් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාර ලැබිය යුතු බදුකුලී හා ලාභ ප්‍රතිශත මණ්ඩලයට අහිමි වී තිබුණි. ඊට අමතරව ව්‍යාපාරික ආයතන 08ක් සඳහා තුම්මුල්ල ලක්සල ගොඩනැගිල්ලේ පළමු මහලේ ඉඩකඩ කුලියට දීම වෙනුවෙන් 2018, 2019 සහ 2020 වර්ෂ වලට අදාලව අයවිය යුතු රු.4,869,200ක කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයට යාබදව පිහිටි ගොඩනැගිල්ල පුද්ගලික ආයතනයක් වෙත ව්‍යාපාර කටයුතු සඳහා ලබා දී තිබූ අතර 2019 වර්ෂයේ සිට ලැබිය යුතු රු.7,643,754 ක කුලී ආදායම අයකර ගැනීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

(ක) අමාත්‍ය මණ්ඩල තීරණ අංක 12/1523/553/020 හා 2012 ඔක්තෝබර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මඟින් ගාල්ල උණවටුන සීමා සහිත ලංකා සළුසල ශාඛාව පිහිටි දේපල ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත නීත්‍යානුකූල අයිතිය පැවරීමට අනුමැතිය ලැබී තිබූ අතර ඒ අනුව 2012 දෙසැම්බර් 12 දින දේපල මිලදී ගැනීම සඳහා රු. 15,248,576ක් සළුසල ආයතනයට ගෙවා තිබුණි. මෙම දේපල සම්බන්ධයෙන් සළුසල ආයතනයට එරෙහිව වෙනත් පාර්ශවයක් විසින් කොළඹ දිසා අධිකරණයේ අංක DMR 4421/10 යටතේ නඩුවක් ගොනුකර ඇති අතර තවදුරටත් නීතිමය කටයුතු අවසන් කර නොමැති හෙයින් දේපල මිලදී ගැනීම සඳහා මුදල් ගෙවා වසර 10ක් ඉක්මගොස් ඇතත් එම දේපලෙහි නීත්‍යානුකූල අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති